# සාහිත්‍යය, දේශපාලනය හා විදුලි බල්බය

සාහිත්‍යය යනු සමාජයීය නිර්මාණයක් ලෙස ගත්කල අනෙක් නිර්මාණ සමග බැඳී ඇත. අප පසුගිය ලිපි කිහිපයකින් පෙන්නුම් කිරීමට තැත් කෙළේ මේ සම්බන්ධතාවය ය. එපමණක් නොව දේශපාලනය ද සමාජයීය නිර්මාණයකි. සමජ විකාශය අනුව ඒ ඒ සමාජ තම තමන්ට අවශ්‍ය දේශපාලන සංස්ථා නිර්මාණය කරගනියි. අද ලංකාවේ අපේ අවශ්‍යතාවනට අනුරූප වූ දේශපාලන සංස්ථා සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කරගැනීමට වෑයම් කෙරෙයි. එහෙත් එසේ කිරීමේ දී විජාතික බලවේගවලට හා ඔවුන්ගේ අවශ්‍යතාවනට යටවීමට අපට සිදුවෙයි.

දේශපාලනයවත් සාහිත්‍යයවත් එකිනෙකා පරයන සංසිද්ධි නො වෙයි. ඉන් එකක් අනෙකෙහි පදනම වන්නේ නො වෙයි. දේශපාලන සංවාදය හෝ සාහිත්‍ය සංවාදය හෝ අනෙක් සියළු සංවාද යටපත්කරන උත්තර සංවාදයක් වන්නේ නො වෙයි. සිංහල සාහිත්‍යයෙහි වර්ධනයක් නැත්නම් එයට හේතුව උත්තර දේශපාලන සංවාදයක් නොමැතිවීම හෝ දේශපාලනයෙහි ඉදිරියට යෑමක් නොමැති නම් එයට හේතුව සාහිත්‍ය සංවාදයක් නොමැතිවීම හෝ නො වෙයි. එකක් උත්තර සංවාදයක් කිරීම යන්න ඌනිතවාදයෙන් ගලා එයි. ඇතැමුනට දේශපාලනය අන් සියල්ලට වඩා ප්‍රධාන යැයි පෙනී යන්නේ දේශපාලන බලය ලබාගැනීමෙන් බොහෝ දේ කළහැකි බැවිනි. එහෙත් දේශපාලන ආයතන නිර්මාණයෙහි ලා අනෙක් ක්ෂෙත්‍ර බලපායි.

මෙයින් අදහස්වන්නේ ඒ එකක් අනෙකට වඩා ප්‍රධාන නො වන්නේ ය යන්න පමණ ය. එහෙත් ඒ අතර සම්බන්ධයක් නැතැයි මෙයින් අදහස් නො කෙරෙයි. දේශපාලනය හා සාහිත්‍යය අතර පමණක් නොව, විද්‍යාව, දර්ශනය, සංගීතය ආදී සියල්ල අතර සම්බන්ධයක් වෙයි. ඒ සියල්ල සමාජයීය නිර්මාණ වෙයි. එබැවින් ම ඒ අතර සම්බන්ධකම් වෙයි. සමාජය යනු මිනිසුන්ගේ පමණක් නොව මේ සියළු ආයතන, දැනුම් පද්ධතීන්හි ද එකතුව වෙයි. බටහිර විද්‍යාව බටහිර යුරෝපයේ පසුගිය සියවස් පහක පමණ කාලයක ඇති වී වර්ධනය වන්නේ සාහිත්‍යයෙන් හෝ දේශපාලනයෙන් හෝ වෙන් වී නො වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය නොමැතිව මේ එක් වර්ධනයක්වත් සිදු නො වෙයි.

අද සංගීතය තාක්ෂණය මත යැපෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ තාක්ෂණයට සංගීතයෙන් කිසිවක් අත්නොවන්නේ ය යන්න නො වෙයි. සෘජුව ම මෙන් ම වක්‍රව ද තාක්ෂණයේ වර්ධනයට සංගීතය යෙදෙන්නේ ය යන්න මගේ පිළිගැනීම වෙයි. ඇතැම් සංගීත බණ්ඩයක් සඳහා අවශ්‍ය තාක්ෂණය දැනට වර්ධනය වී නැත්නම් ඒ වර්ධනය කිරීමට සංගීතයෙන් තාක්ෂණයට බලපෑම් කෙරෙයි. සංගීතය විසින් සාහිත්‍යයට ද සාහිත්‍යය විසින් විද්‍යාවට ද විද්‍යාව විසින් තාක්ෂණයට ද ආදී වශයෙන් වක්‍රව කෙරෙන බලපෑම් ද මෙහි දී අපේ සැලකිල්ලට යොමු විය යුතු ය. යම්කිසිවකු මේ සම්බන්ධකම් ගැන අධ්‍යයනයක යෙදෙන්නේ නම් මැනවි.

විද්‍යාව හා තාක්ෂණය අතර ඇති සම්බන්ධකම් ගැන අපි දනිමු. එහෙත් බොහෝ දෙනා සිතන්නේ බටහිර විද්‍යාව වර්ධනය වී එහි ප්‍රවාද පදනම් කරගනිමින් බටහිර තාක්ෂණය වර්ධනය වන බව ය. ඒ අනුව නම් බටහිර විද්‍යාව බටහිර තාක්ෂණයට වඩා ප්‍රධාන ය. එහෙත් බටහිර තාක්ෂණය බටහිර විද්‍යාවට ඉදිරියෙන් සිටිමින් වර්ධනයට මග පෙන්වන අවස්ථා ද වෙයි. ඇතැම් අවස්ථාවක පර්යේෂණ ප්‍රවාදවලට වඩා ඉදිරියෙන් සිටින අතර තවත් අවස්ථාවක ප්‍රවාද පර්යේෂණයට මග පෙන්වයි.

තාක්ෂණය වර්ධනයවීම සඳහා ප්‍රවාද අවශ්‍ය ම නැත. තෝමස් අල්වා එඩිසන් විද්වතා විදුලි බල්බය නිර්මාණය කෙළේ ඕම්ගේ නියමය දැනගෙන නො වෙයි. එසේ නම් ඒ සඳහා එඩිසන් විද්වතාට බලපෑවේ කුමක් ද? පැහැදිලිව ම ඔහු ජීවත් වූ සමාජ පරිසරය ය. ඔහුගේ සංස්කෘතිය ය. විදුලි බල්බය අවශ්‍ය වූ සමාජයක ඔහු ජීවත්විය. එවැන්නක් නිර්මාණය කිරීම සඳහා ඔහු මෙහෙයවනු ලැබිණි. විදුලි බල්බයේ සූත්‍රිකාවේ විදුලිය ගමන්කිරීමේ දී ඕම් නියමයේ අදාළත්වය ගැන දැනුමක් නොවීම එඩිසන් විද්වතාට ප්‍රශ්නයක් නො විණි.

අප එයටත් වඩා දුර ගියහොත් ඉලෙක්ට්‍රෝනය යන්න විද්‍යුතයේ අවශ්‍ය සංකල්පයක් වුවත් විදුලි බල්බය නිර්මාණයේ දී ඒ අදාළ නොවන බව පෙනී යනු ඇත. එහෙත් ඒ අතර සම්බන්ධයක් ඇති බව අපි දනිමු. මේ කරුණුවලින් පෙනී

© Prof. Nalin De Silva

යන්නේ බටහිර විද්‍යාව හා බටහිර තාක්‍ෂණය අතර ඇත්තේ ඉන් එකක් ප්‍රධාන වන සම්බන්ධයක් නොව එකක් අනෙක මත වෙළී ඇති සම්බන්ධයකි. බටහිර විද්‍යාව හා බටහිර තාක්‍ෂණය එකිනෙක මත වෙළී ඇත. අද ඇතැමුන් බටහිර තාක්‍ෂණයේ වැරදිවලට බටහිර විද්‍යාවට දොස් නොකිවයුතු යැයි කියන නමුත් ඉන් එකක් වැරදිකරු වී අනෙක නිවැරදිකරු විය හැකි නොවෙයි.

බටහිර තාක්‍ෂණය විසින් නිර්මාණය කෙරී ඇති ඇතැම් දෑට වගකිවයුත්තේ බටහිර විද්‍යාව පමණක් නො වෙයි. බටහිර සාහිත්‍යය ද එයට වගකිවයුතු ය. උපත් පාලන පෙති හා උපකරණ හරි හෝ වැරදි හෝ වුවත් බටහිර තාක්‍ෂණයේ ප්‍රතිඵල වෙයි. ඒ නිෂ්පාදනය සඳහා බටහිර විද්‍යාව ද යොදා ගැනෙන බව පැහැදිලි ය. බටහිර සාහිත්‍යය ඒ සඳහා දායක වන්නේ කෙසේ දැයි යමකුට ප්‍රශ්න කළ හැකි ය. ලෝරන්ස් විද්වතා වැන්නන්ගේ සාහිත්‍යය බිහිවූයේ සෘජුව ඒ සඳහා යැයි කිවහොත් කිසිවකු ඒ නොපිළිගනු ඇත. එහෙත් ඒ සාහිත්‍යයෙන් එවැනි උපකරණ සමාජයෙහි පිළිගැන්වීමට යම් දායකත්වයක් ලැබී ඇත.

බටහිර විද්‍යාව, බටහිර තාක්‍ෂණය, බටහිර සාහිත්‍යය, බටහිර සංගීතය ආදී සියල්ල එකිනෙක සමග අත්වැල් බැඳගෙන එකට එකම වේගයකින් ගමන්කරන බවක් මෙයින් නො කියැවෙයි. ඇතැම් කාල පරිච්ඡේදයක විද්‍යාව ඉදිරියෙන් වෙයි. තවත් කාල පරිච්ඡේදයක දී තාක්‍ෂණය ඉදිරියෙන් වෙයි. ඇතැම් අවස්ථාවක ඉදිරියෙන් ඇත්තේ චිත්‍ර ය. එසේත් නැත්නම් මූර්ති කලාව ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ විකාශයෙහි දී ඒ ඒ සංස්කෘතීන් විසින් ඒ ඒ දෑ නිර්මාණය කෙරී ඇත. දර්ශනය ජර්මනියේත්, යාන්ත්‍රිකය හා තාක්‍ෂණය එංගලන්තයේත් වර්ධනය විය. ප්‍රංශයේ කලා ශිල්ප වර්ධනය විය. සමස්තයක් ලෙස ගත්කල එසේ වුවත් එංගලන්තයේ හෝ ප්‍රංශයේ හෝ දර්ශනය කිසිසේත් ම වර්ධනය නොවී යැයි කිව නො හැකි ය.

බටහිර ලෝකයේ ඇති ඇතැම් දේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පෙර නිර්මාණය වූ දෑ ය. එහෙත් ඒ ඇතැම් ආයතනයක් හෝ සංස්ථාවක් හෝ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ඉක්මණින් හෝ ඉතා කල්ගත වී හෝ අවශෝෂණය වී ඇත. විශ්වවිද්‍යාල එලෙස කල්ගත වී අවශෝ:ණය ආයතනවලට උදාහරණ ය. බටහිර කතෝලික චින්තනයේ උපත ලැබූ විශ්වවිද්‍යාල සියවස් ගණනාවක් යුරෝපීය මධ්‍යකාලීන ආයතන ලෙස පැවතී අද තම පැවැත්ම වෙනුවෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අනුගත වෙමින් පවතියි. තව දශක කිහිපයක් යනවිට විශ්වවිද්‍යාල යනු බටහිර කතෝලික පල්ලියේ ආකෘතියෙන් මුළුමනින් ම වෙන් වූ ආයතන බවට පත්වෙනු ඇත. විශ්වවිද්‍යාල වෙනුවට ඒ ඒ විෂය හෝ විෂය ධාරා පමණක් ඉගැන්වෙන ආයතන බිහිවීම වැළැක්විය නො හැකි ය. විශ්වවිද්‍යාල එසේ පරිවර්තනය නොවන්නේ නම් ඒ විශ්වවිද්‍යාල වැසී යනු ඇත. සමස්තය පිළිබඳ අදහසක් ඇති විශ්වවිද්‍යාල බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට නො ගැලපෙයි. පුද්ගලය නම් නමින් හෝ පීඨ කිහිපයක එකතුවක් ලෙස විශ්වවිද්‍යාල බටහිර රටවල මෙපමණ කලක් පැවතීම ය. ඔපෙරාව නමින් හැඳින්වෙන කලා ශිල්පය ද එලෙස මධ්‍යකාලීන කතෝලික වැඩවසම් යුරෝපයේ බිහිවී තවමත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පැවතෙන කලා ශිල්පයකි. එහෙත් ඒ ක්‍රමයෙන් අභාවයට පත්වෙමින් ඇත. ලංකාවේ ඇතැමුන් මෙරටට හඳුන්වාදීමට වලිකන්නේ, එහෙත් ජනතාව අතරට නොයන්නේ, එවැනි මියැදෙන කලාවකි.

අපට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ලැබුණේ යටත්විජිතවාදයේ අංගයක් ලෙස ය. එය කිසි දිනෙක මෙරට පැලපදියම් නො වී ය. එහෙත් එහි බොහෝ අංග මෙරට වැසියන්ට වුව ද ආකර්ෂණීය වෙයි. පෞද්ගලිකත්වය ඉස්මතු කරන, ඉන්ද්‍රිය පිනවීමට අනුබල දෙන සංස්කෘතියක් ජනතාවගෙන් සැමදාටම ඉවත්කර තිබීම පහසු කටයුත්තක් නො වෙයි. මෙතෙක් කල් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ජනතාවගෙන් ඉවත්කර තිබුණේ ජනතාව අතර තිබූ සාමූහික විඥානය හේතුවෙනි. ඒ විඥානය සිංහලයන් අතර නම් සිංහල බෞද්ධ චින්තනය මත පදනම් විණි. සිංහල බෞද්ධ චින්තනය ශක්තිමත් ව තිබෙනතාක් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ඒ පසාරුකර ගෙන යා නො හැකි විය. එහෙත් බටහිර අධ්‍යාපනය මෙරට ගම්වලට ගෙන යෑමේ ප්‍රතිඵලය වූයේ ගම්වල වෙනස් තත්වයක් නිර්මාණය වීම ය. අද වන විට පාසල්, විශ්වවිද්‍යාල පමණක් නොව එයටත් වඩා ප්‍රබල ලෙස ජනමාධ්‍ය ඔස්සේ සිංහල බෞද්ධ චින්තනය දුර්වල කරමින් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආධිපත්‍යය රට පුරා පැතිරෙයි.

© Prof. Nalin De Silva

අපට අවශ්‍ය වන්නේ සිංහල සාහිත්‍යය හා සිංහල සාහිත්‍ය විචාරය කෙසේ සකස් කරගගන්නේ දැයි සාකච්ඡා කිරීමට ය. වර්තමානයෙහි බටහිර විද්‍යාව ඇතුළු අනෙක් දැනුම් පද්ධතීන් මෙන් ම සාහිත්‍යය ද පැමිණියේ බටහිරින් ය. එසේ පැමිණියේ ද බටහිර යටත්විජිතවාදයෙහි ප්‍රතිඵලයක් ලෙස ය. මේ සාහිත්‍යය හා සාහිත්‍ය විචාරය මෙරටට හඳුන්වාදුන්නෝ, එනම් එහි දී බටහිර යටත්විජිතවාදයෙහි ප්‍රධාන නියෝජිතයෝ, මාර්ටින් වික්‍රමසිංහ මහතා හා එදිරිවීර සරච්චන්ද්‍ර මහතා වූහ. පසු කලෙක 1956න් පසු සෝවියට් දේශය සමග තානාපති සබඳකම් ඇති කරගැනීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය සාහිත්‍ය ක්ෂෙත්‍රයෙහි කරළියට පැමිණියේ ය.

මුල දී මාර්ටින් වික්‍රමසිංහ මහතා හා එදිරිවීර සරච්චන්ද්‍ර මහතා යථාර්ථවාදීහු වූහ. ගුණදාස අමරසේකර මහතා වැන්නෝ ද යථාර්ථවාදීහු වෙති. එයට අමතර ව සාමාන්‍යයෙන් ට්‍රොට්ස්කිවාදී ගුරුකුලවලට අයත්වූවෝ ද යථාර්ථවාදීහු වෙති. එහෙත් කොමියුනිස්ට් පක්ෂය පිළිගත්තේ ස්ටැලින්වාදී සාහිත්‍ය විචාරය ය. එය සාමාන්‍යයෙන් සමාජ සත්තා යථාර්ථවාදය (social realism) ලෙස හැඳින්වෙයි. වික්‍රමසිංහ මහතා ද අවසන් කාලයෙහි සමාජ සත්තා යථාර්ථවාදය දෙසට ඇදී ගියේ ය. සමාජය පිළිබඳ යම් විඥානයක් වික්‍රමසිංහ මහතාට තිබූ බවට සැකයක් නැත. එහෙත් ඒ මහතා ලියා ඇති දෙයින් පෙන්නුම් කරන්නේ ඒ මහතාට මාක්ස්වාදය ගැන එතරම් අවබෝධයක් නොතිබූ බව ය. ඒ මහතා බොරු විද්‍යාත්මක චින්තනයකට හා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට යටවීමේ ප්‍රතිඵලය වයේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ එකල ප්‍රධාන නියෝජිත ආයතනය වූ ලංකා විශ්වවිද්‍යාලය මගින් ඒ මහතා ඔසවා තැබීම ය. වික්‍රමසිංහ මහතාට බුදු දහම ගැන ද නිවැරදි අවබෝධයක් නො වී ය. කන්නිමහර සුමංගල හිමියන් ද යක්කඩුවේ ප්‍රඥාරාම හිමියන් ද ඒ බව ඉතා මැනවින් පෙන්වා දී ඇත. එහෙත් උන්වහන්සේලාට ලංකා විශ්වවිද්‍යාලයේ අධිපතිවාදී බලය නොතිබූ හෙයින් දේශපාලන වශයෙන් මාර්ටින් වික්‍රමසිංහ මහතා පරාජය කිරීමට නොහැකි විය. ගුණදාස අමරසේකර මහතා පෙන්වා දී ඇති අන්දමට සරච්චන්ද්‍ර මහතාට සමාජ විඥානයක් පවා තිබී නැත. සමාජ විඥානය පොතපතින් නොව අත්දැකීමෙන් ඇතිකර ගන්නකි. සරච්චන්ද්‍ර මහතා සිංහල බුද්ධාගම ගැන දැන සිටියේ පොතපතින් යැයි අමරසේකර මහතා කරන නිගමනය අසත්‍යයක් නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva